කෙටි කතාව

# අපල කාලෙ

ශ්‍රියා කුමාරසිංහ නවසීලන්තය



සිරිතේලිස් උදේ සිට රෑ වෙන තුරු වැඩ කලත් සුගුණවතීට පේන්නේ නොකෙරුණ හරිය විතරය. සුගුණවතීගේ පැදුරේ' හැමදාම නිදා ගන්නට ඔනෑ කලත් ඉඩක් ලැබෙන්නේ සුගුණවතීට හිතුණ දාට විතරය. කෝකටත් ආයෙත් සැරයක් හඳහන බලා ගත්තොත් හොඳයයි සිරිතේලිස්ට හිතුණි.

**සිරිතේලිස්** ඇලට බැස දබරැඟිල්ලට ගත් හීන් සුදු වැලි ටිකකින් දත් මැද දෝතට ගත් වතුරෙන් මුහුණ කට සේදුවේය. දත් වල ඇති බුලත් කහට ඇරීමට බෝඹු කෝටුවට වඩා හීන් වැල්ල හොඳය. එතකොට තව දවසකට හමාරකට දත් මදින්නට ඔනෑ නැත. පලයකාට් සරමට උඩින් ඉණ වට ඔතා ගෙන සිටි අමුඩ ලේන්සුව ගෙන මුහුණේ වතුර පිස දමමින් ඇල කණ්ඩිය මත ඉඳ ගත් සිරිතේලිස් වෙල් යාය දෙස බැලුවේය. පහුගිය දිනවල කොහේදෝ සිට කඩා පාත් වුන අකල් වැස්සට ඇල කණ්ඩිය කැඩී වෙල් යායට උඩින් ගලා ගිය වතුර කන්දරාවත් සමග පාවී ආ සුදු වැල්ලෙන් මහ ලියැද්දේ බාගයකටත් වඩා පිරී ඇත. කරුමෙට ඇල කණ්ඩිය කැඩුණේද හරියටම සිරිතේලිස්ගේ ලියැද්ද හරියෙන්මය. හොඳින් පණ පෙවී කඳ කෙලින් වැඩී තිබුණ ගොයම් ගස් එහෙම පිටින්ම වැල්ලට යට වී ගොසිනි. තව මාසයක් එක දිගට ඇද්දත් මේ වැලි ගොඩ නම් කුඹුරෙන් අහක් කරන්නට බැරියයි සිරිතේලිස්ට සිතේ. හැමදාම පාහේ උදේ වෙලට ආ විට ඇල ඉවුර පැත්තේ නියරේ' කක්කුටු හිල් වසා දැමීම සිරිතක් ලෙස කර ගෙන ආවද මෙදා පාර පිටාර ගැලූ මහ ජල කඳට ඒ පැලැස්තර දැමීමෙන් වැඩක් නොවුණි. සිරිතේලිස්ට පහුගිය දොහක ජුවානිස් ගුරුන්නාන්සේ කියූ යමක් සිහිපත් විය.

බොහොම අපල කාලයක් බොලාට ලබල තියෙන්නෙ ඕං. හෙනහුරා හතේ. මේ වෙලාවෙ මොකට අත ගැහුවත් වගතුවක් නෑ.

සිරිතේලිස්ට සුගුණවතී මතක් විය. ඔහු ගෙදරින් එන විට ඇය සිටියේ පිළිකන්නේ වළං මැස්ස ළඟ හිටගෙන මයියොක්කා අල සුද්ද කරමිනි. පිලේ ගැට්ට උඩ බෙලෙක් පිඟානක ඇති සුවඳ හමන මයියොක්කා කෑලිත්, කට්ට සම්බෝලෙත්, අමු පොල් අහුරත් සිතේ මවා ගත් සිරිතේලිස්ගේ බඩ ගොර ගොර ගෑවේය. ඇල කණ්ඩියෙන් නැගිට ගත් සිරිතේලිස් දෙවටට නැමුණු බට පඳුරු වල පිහි තල වැනි බට කොල වලින් බේරී බේරී ගේ දිහාවට පය එසවීය. වැටේ ලී කඩුල්ල හරියට එද්දී සුගුණවතී ගෙයි පෑල දොරකඩ සිට වතුර කොරහක් මිදුලේ කෝලිකුට්ටු පඳුර දිහාවට විසි කර යළි ගෙතුලට යනු පෙණින. බඩගින්න නිසා පය ඉක්මන් කලද සුගුණවතී දුටු විට සිරිතේලිස් පසුබා ගියේය.

සිරිතේලිස් සුගුණවතීට බොහෝ ආදරේය. තමාගේ හැටියට ඈ ඔනෑවටත් වඩා පෙනුමය. ඇඟපතද බොහොම සරුය. ඒ හැම එකකටම සිරිතේලිස් ආසා වුවද වරකට ඈ කියන කතා ඔහුට ඉහිලුම් නොදෙයි.

අනේ අම්මප. මං නං දැකල නෑ මෙහෙම කම්මැලියෙක්. ගොඩමඩ කොච්චර තිබුණත් මොකටද? බාගයක් වල් වැදිල. ලියැදි වලින් කොටහක තාම ඉපනැලි. පිරිමියෙක් උනාම කොච්චර කඩිසර වෙන්න ඔනැද?

සිරිතේලිස් උදේ සිට රෑ වෙන තුරු වැඩ කලත් සුගුණවතීට පේන්නේ නොකෙරුණ හරිය විතරය. සුගුණවතීගේ පැදුරේ' හැමදාම නිදා ගන්නට ඔනෑ කලත් ඉඩක් ලැබෙන්නේ සුගුණවතීට හිතුණ දාට විතරය.

කෝකටත් ආයෙත් සැරයක් හඳහන බලා ගත්තොත් හොඳයයි සිරිතේලිස්ට හිතුණි.

පිලට ගොඩ උන සිරිතේලිස් වලාපොට ගසාගෙන ආ සරම දික්කොට වැල් ඇඳේ ඉඳ ගත්තේය. හිතින් හිතුවා වගේම පිල උඩ මයියොක්කා පිඟාන සිරිතේලිස් එන තෙක් බලා උන්නාක් මෙනි. බෙලෙක් පිඟන් ගැටෙන හඬ ඇසී පිලට එබුණ සුගුණවතී ගොළුබෙල්ලා කටුවට රිංගුවාක් මෙන් යලි ගෙතුලට වැදුණාය. හිත රිදෙන මුකුත් නොකියා එහෙම ගිය එක හොඳයි යි සිරිතේලිස්ට දෑසින් පිඟානට කීවේය. කටට දෙකට මයියොක්කා පිඟාන හිස් කල සිරිතේලිස් ගේ වටෙන්ම පිලිකන්නට ගොස් දිය මැස්සේ මැටි කලෙන් වතුර පොල් කට්ටක් නවා ගෙන බිව්වේය. පෑල දොරෙන් එබී බැලූ ඔහුට දොරට පිටුපා ලිප ලඟ බංකුවක වාඩිවී සිටින සුගුණවතී පෙණුනි. යට ලීයක එල්ලා තිබුණ පැදුරු ආනේ කොනකට හීන් සැරේ' අත දැමූ සිරිතේලිස් හඳහන අතට ගෙන නැවත මිදුලට බැස ඉක්මන් අඩි තබා පාරට පිවිසියේය.

මිය ගිය මෑණියන්දෑ තමා හා සුගුණවතීගේ කසාදය තීන්දු කර ගෙන ආ දින තල් කොලයක පන් හිඳෙන් ලියා ඇති හඳහන මහාර්'ඝ වස්තුවක් ලෙස තමාට දුන් හැටි සිරිතේලිස්ට මතකය.

මේක බොහෝම පරවේසමෙන් තියා ගන්නේ'න මයෙ පුතේ. ලෙඩට දුකට පිහිට වෙන්න තියෙන දේ. ගෑණිත් අපරාදෙ කියන්න බෑ. උඹටම ගැලපෙනව. උඹවත් නැගිටවල ගනියි. හොඳ දහිරි කාරී.

හඳහන ටිකක් ගණ කමට දැණුනෙන් වඩා ඔනෑ කමින් පිරික්සා බැලූ සිරිතේලිස්ට එය එකක් නොව දෙකක් බව පෙණුනි. එකත් එකටම අනිත් එක සුගුණවතීගේය. ඒකත් එහෙම වුණ එක වෙලාවේ හැටියට හොඳය. දෙන්නාගේම හඳහන් එක වර බලා ගෙන ආ හැක.
සිරිතේලිස් ගංසබා පාර දිගේ රට උළු ගෙදරට ළඟා වන විට ඉස්තෝප්පුවේ හාන්සි පුටුවක වාඩිවී සිටි ජුවානිස් ගුරුන්නාන්සේ ගැමියෙකු හා සල්ලාපයේ යෙදී සිටියේය. මැදි වියට කිට්ටු කරමින් සිටියද තනිකඩ ජීවිතයක් ගත කල ගුරුන්නාන්සේගේ ඇඟපත තවම තරුණයෙකුගේ මෙන් පැහැපත්ය.
සවිමත්ය. මහ විදානේ මිය ඇදුණ පසු කේන්දර බැලීම හා නැකත් වැඩ ජුවානිස් අප්පුහාමි වෙත පැවරුණ හෙයින් ජුවානිස් ගුරුන්නාන්සේ යයි ඔහු අමතන්නට ගම්මු පුරුදු වුහ. කතාබහට රුසියෙකු වු ඔහුට පාළු කපන්නන්ගෙන් අඩුවක් නොවුණි.

සිරිතේලිස්ද මගදී අහුලා ඔඩොක්කුවේ දමා ගෙන ආ පුවක් ගෙඩි කීපය ඉස්තෝප්පුවේ කොනකට හලා සිමෙන්ති පඩිය මත වාඩිවී අසල වු බුලත් හෙප්පුවෙන් විටක් චීදමින් කතාවට හවුල් විය. මඳ වේලාවකින් ගැමියා පිටව ගිය පසු ගුරුන්නාන්සේට කිට්ටු වූ සිරිතේලිස් දෑතින්ම හඳහන් දෙක දී ආ කාරිය කීවේය. මාරුවෙන් මාරුවට හඳහන් දෙකේ කොටුවල ලියා ඇති අකුරු හා ඉලක්කම් දෙස බැලූ ගුරුන්න්න්සේ රැ ල් බුරුල් හැරියේය.

ඈ බං සිරිතේලිස්. සුගුණවතීගෙ කේන්දරේ' බොහොම බලගතු එකක්නෙ බං. උඹට නං ආංබාං කොරන්න අමාරු වෙයි. උඹෙ අපල කාලෙ ගෙවෙන කං ටික කාලෙකට උඹ ගෙදරින් මගෑරල හිටියොත් හොඳයි. නැත්තං උඹෙ ග්‍රහයො නීච වෙලා ඉන්න මේ වෙලාවෙ දෙන්න එක ගෙදර හිටියොත් දීගෙ ඇරෙන්නත් බැරි නෑ.

සිරිතේලිස්ට හීං දාඩිය දැම්මේය. සුගුණවතී නැති ජීවිතයක් ගැන හිතන්නටවත් සිරිතේලිස් බය විය. ගුරුන්නාන්සේගේ කතාව හරියට හරි යයි ඔහුට හිතුණි.

දැනටමත් වත්තෙ පිටියෙ වැඩ උනත් මට වැඩිය කරන්නෙ උන්දැනෙ. කේන්දරේ' හපං කමට තමයි එහෙනං. පොඩ්ඩක් මගෑරල ඉන්න කිව්වත් කොහේ යන්නද ඉතිං?
කල්පනා කරමින් මගක් දුර ආ සිරිතේලිස්ට හදිසියේම මින්නේරියට දීග දුන් හීන් නඟා මතක් විය. හීන් මැණිකේ දීග ගොස් අවුරුදු ගණනාවක් ගත වුවද සිරිතේලිස් එහි ගොස් ඇත්තේ ඈ කැන්දා ගෙන ගිය දා පමණි. ටික දවසකට මින්නේරි යනව යි සිරිතේලිස් සිතා ගත්තේය.

ගෙදර ගිය සිරිතේලිස් තමා හෙට උදෙන්ම නඟාගේ දුක සැප බැලීමට යන බව කීවේය. හඳහන් බැලූ කතාව කියන්නට හිත් දුන්නේ නැත. ඇරත් සුගුණවතී හඳහන් විශ්වාස නොකරයි. ඇය කියන්නේ හැම දෙයක්ම වෙන්නේ අතේ පයේ හිතේ දහිරියෙන් බවයි. අනිත් කොයි දේ තිබුණත් මේ ගෑණිට මොලේ නං කලඳක්වත් නෑ. ඒ වෙලාවට මග හැර යන සිරිතේලිස් එසේ සිතයි, කල යුතු වැඩ රාජකාරි එමට තිබියදී හදිසියේම නෑගම් යාමට තීරණය කිරීම ගැන සුගුණවතී දොස් කීවද හැන්දෑ වන විට ගෝනි මල්ලක් පුරවා දෙල්, කොස්ඇට, අල බතල සූදානම් කර තැබුවාය. දින දෙක තුනකින් ආපසු එන බව කිව් සිරිතේලිස් පසුදා පාන්දරින්ම ගංසබා හංදියට ගොස් බස් එකට නැග්ගේය.

බොහෝ කාලයකින් තම එකම සහෝදරයා තමා බැලීමට පැමිණීම ගැන හීන් මැණිකේ ඉතා සතුටු වූවාය. සතුටු වීමට තව බොහෝ කාරණා තිබුණි. රජරට ගොයම් පැහී තිබුණ කාලය බැවින් කුඹුරු වැඩ එමටය. හැම වතාවකම උදව්වට එන ගමේ කීප දෙනා හැරුණු විට දෙතුන් දෙනෙක් වත් දවස් කුලියටද ගත යුතුය. අයියන්ඩි පැමිණ සිටින හෙයින් එක කුලී වැඩ කාරයෙකු අඩු කර ගත හැකිය. මස්සිනාද බොහෝ ආදර කරුණා පාමින් සිරිතේලිස්ට සැලකුවේය. තමා ටික දවසකින් ආපසු යාමට හිතා ගෙන පැමිණි බව කී විට කුඹුරු වැඩ කාලය ඉවර වෙන තෙක් ඉන්නැයි නගා මස්සිනාලා පෙරැ ත්ත කලෝය. හැම තැනම වැඩ පටන් ගත් පසු කුලී කරුවන් සෙවීමේ අපහසුවද කීවෝය. උදේ සිට රෑ වෙන තෙක් කිරීමට ඇති වැඩ කන්දරාව මතක් වන විට ආපසු යන්නටම හිතුණද ජුවානිස් ගුරුන්නාන්සේ කියු දේවල් නිතර සිහිපත් කල සිරිතේලිස් රාහු කාලය ගෙවෙන තෙක් සිට ආපසු යමි "යි හිතා ගත්තේය.

කාලය කෙමෙන් ගෙවුණි. නොදැනීම සිරිතේලිස්ගේ දෑත දෙපය බර වැඩ වලට හුරු වුවද සුගුණවතී නොදැක තවත් ඉන්නට බැරි බව දැනෙමින් තිබුණි. අපල ඉතිරි වී තිබුණත් තව ඇත්තේ ටික කාලයක් විය යුතු යයි සිතූ සිරිතේලිස් නගාලාගේ ඇවිටිලි නොතකා හදිසියේම ගමනට පිටත් වුණි. හැන්දෑ වන විට ගමට සේන්දු වූ සිරිතේලිස් ගංසබා පාර දිගේ රටඋළු ගෙදර පසු කරන විට ඈත ගෙමිදුලේ කාන්තාවක් පොල් පිති කපමින් සිටිනු පෙණින.
**අප්පද බොල. මං නොහිටපු කාලෙට ගුරුන්නාන්සෙ පෙලවහකුත් කර ගෙනද කොහෙද. අනේ හොඳා.**
ගෙදරට ළඟා වූ සිරිතේලිස්ට ගෙයි දොරවල් වසා දමා ඇති බවද වටපිටාව වල් බිහිවී ඇති බවද දුටුවේය. සුගුණවතීට ලෙඩක් දුකක් වත් දැයි සිරිතේලිස්ට බය හිතුණි. දොරවල් අගුළු දමා ඇත. ගෙය වටේම ඇවිද කිසිත් සිතා ගත නොහැකිව වැට කඩුල්ල අසලට වී වටපිට බලමින් සිටින විට පාර දිගේ මී හරක් රංචුව දක්කා ගෙන එන කීරාල දැක හෝඩුවාවක් දැන ගත හැකි වේ යයි සිතා පාරට පැන්නේය.
හාන්දුන්නේ මේ සිරිතේලිස් නොවැ. කොහෙද යකෝ උඹ මෙච්චර කල් වහං වෙලා උන්නෙ? මං මින්නේරියෙ නගාලයි අහ ගියා මාමණ්ඩි. ඒක යසයි නෑගං ගියා. ආං අර අම්මණ්ඩි දවස් දෙකෙන් එනවැයි කිව්ව උඹ නැති හිංද ගම දෙවනත් කොලා.
කොයි දැං සුගුණවතී? මාත් මේ විපරං කෙරුවෙ ඒකයි ගෙදර නැති හිංද. ආං දැං මාස ගානක් වෙනව ජුවානිස් ගුරුන්නාන්සෙගෙ අහට වෙලා. උන්දැ උඹ ආයෙ එන එකක් නැතෙයි කියල ඒකිව එහාට එක්කං ගියානෙ අනේ අපොයි කියල.

සිරිතේලිස් ඉබේටම බිම ඉන්දවුණි. ■